**වර්ෂ 2022 ක් වූ මැයි මස 26 වන දින පෙ.ව 10.00 ට පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද මාසික මහා සභා රැස්වීමේ වාර්තාව**

පැමිණීම

| | | |
|---|---|---|
| 01. ගරු සභාපති | - | ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා |
| 02. ගරු උප සභාපති | - | එච්.ඒ නන්දසෝම මහතා |
| 03. ගරු මන්ත්‍රී | - | වී.මුරලිදරන් මහතා |
| 04. ගරු මන්ත්‍රී | - | ජී.එස්.ඒ ෆොන්සේකා මහතා |
| 05. ගරු මන්ත්‍රී | - | කේ.ඕ.සෝමතිලක මහතා |
| 06. ගරු මන්ත්‍රී | - | එම්.එල්.සී.ආර් මොල්ලිගොඩ මහතා |
| 07. ගරු මන්ත්‍රී | - | ජී.කේ.පී ෆොන්සේකා මිය |
| 08. ගරු මන්ත්‍රී | - | ශාන්තලාල් පෙරේරා මහතා |
| 09. ගරු මන්ත්‍රී | - | ටී.ඒ.ඩී.සී දමයන්ති මිය |
| 10. ගරු මන්ත්‍රී | - | එච්.ජී මෛත්‍රීපාල මහතා |
| 11. ගරු මන්ත්‍රී | - | අයි.රාමකිලි මහතා |
| 12. ගරු මන්ත්‍රී | - | ඒ.ජී.ටී.ඒ සිරිසේන මහතා |
| 13. ගරු මන්ත්‍රී | - | කේ.ඕ කුසුම්ලතා මිය |
| 14. ගරු මන්ත්‍රී | - | එස්.එල්.අරුණ ශාන්ත මහතා |
| 15. ගරු මන්ත්‍රී | - | එන්.එම් සුසිලා දමයන්ති මිය |
| 16. ගරු මන්ත්‍රී | - | එච්.ජී මහින්ද ගුණසේකර මහතා |
| 17. ගරු මන්ත්‍රී | - | එස්.ඒ.ටී පුෂ්පකුමාර මහතා |
| 18. ගරු මන්ත්‍රී | - | පූජ්‍ය නමඩගස්වැව සුගතසෝම හිමි |

නොපැමිණීම

| | | |
|---|---|---|
| 01. ගරු මන්ත්‍රී | - | එච්.ඒ.එන්.සී රණසිංහ මහතා |
| 02. ගරු මන්ත්‍රී | - | එම්.ජී.ඩබ්.කේ.එස් මැණිකේ මිය |

**01. පසුගිය මහා සභා වාර්තාව සභා සම්මත කිරීම**

ගරු මන්ත්‍රී එච්.ජී මෛත්‍රීපාල මහතා

අයවැය සම්බන්ධයෙන් මං ඉල්ලීමක් කරලා මාස 03 ක් උනා.තවම ඒකට නිසි පිළිතුරක් ලැබුනේ නෑ.සභා වාර්තාව නොසැලකිල්ලෙන් එවන්නේ කියලා පේනවා.මගේ වාර්තාවේ එකම පිටුව පිටු දෙකක් තියනවා.

ගරු මන්ත්‍රී මහින්ද ගුණසේකර මහතා

මගේ සභා වාර්තාවෙත් තියනවා සභාපතිතුමනි මං ගිය සභාවේ ප්‍රකාශ කළා වැලිගම්පළ පාරට පළාත් පාලන ආයතන වලින් ගෙවන ලක්ෂ 3 මුදල ලැබුනේ නෑ කියලා.නමුත් මේකෙ සඳහන් වෙලා තියෙන්නේ වැලිගම්පළ පාලමට මාස 06 කින් මුදල් ලැබුනේ නෑ කියලා.ඒකෙ මං යෝජනා කළේ අනිත් ඔක්කොටම ගෙවලා වැලිගම්පළ ව්‍යාපෘතිය සඳහා මාස 06 ක් වෙනවා මුදල් ගෙවලා නෑ කියලා.

ගරු මන්ත්‍රී එච්.ජී මෛත්‍රීපාල මහතා

අයවැය සම්මත උනේ මොන මාසෙද කියලා මං ඇහුවා ඒකට තවම උත්තරයක් ලැබුනේ නෑ.ඉගුරුඔය ගැටලුවටත් ස්තූති කරලා තිබුනා ඉඩම ආරක්ෂා කර ගන්න ඒ අය ගන්න උත්සහය ගැන.ප්‍රාදේශීය සභාවෙනුත් යවලා තියෙනවා ලියුමක් ඒ සමිතියට මේක ඒ අයට අයිති නෑ ඒක රක්ෂිතයේ ඉඩමක් පවරා ගන්න කටයුතු කරනවා කියලා.ඒවා මේකෙ සඳහන් වෙලා නෑ.

ගරු මන්ත්‍රී මහින්ද ගුණසේකර මහතා

2022 අප්‍රේල් මස මහා සභා වාර්තාව සංශෝධන සහිතව සත්‍ය හා නිවැරදි වාර්තාවක් වශයෙන් සභා සම්මත කිරිම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු මන්ත්‍රී ජී.එස්.ඒ ෆොන්සේකා මහතා</u>
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව 2022 අප්‍රේල් මස මහා සභා වාර්තාව සංශෝධන සහිතව සත්‍ය හා නිවැරදි වාර්තාවක් වශයෙන් සභා සම්මත කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

**<u>02. ගරු සභාපතිතුමාගේ විශේෂ නිවේදන</u>**

<u>02 - 01 ප්‍රාදේශීය ලේකම්,ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,පස්බාගේ කෝරළේ,නාවලපිටිය</u>
ප්‍රාදේශීය සෞඛ්‍ය කමිටු රැස්වීම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

<u>02 - 02 පළාත් පාලන කොමසාරිස්,පළාත් පාලන දෙපාර්තමේන්තුව,පල්ලේකැලේ,කුණ්ඩසාලේ</u>
සංවර්ධන ව්‍යාපෘති බිල්පත් පියවීම සඳහා පළාත් පාලන ආයතන වෙත මුදල් ප්‍රතිපූර්ණය කිරිම සම්බන්ධවයි යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

<u>02 - 03 භාණ්ඩාගාරයේ ලේකම්,මුදල් අමාත්‍යාංශය,කොළඹ 01</u>
රාජ්‍ය වියදම් පාලනය කිරිම - ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022 යන මැයෙන් වූ චක්‍රලේඛය සභාගත කරන ලදී.

<u>02 - 04 භාණ්ඩාගාරයේ ලේකම්,මුදල් අමාත්‍යාංශය,කොළඹ 01</u>
2022 වර්ෂය තුළ වියදම් දැරීම සඳහා බලය යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

<u>02 - 05 දිස්ත්‍රික් ඉංජිනේරු(ඉහළ),දිස්ත්‍රික් ඉංජිනේරු(ඉහළ)කාර්යාලය,නානුඔය</u>
දුම්රිය රක්ෂිතය තුළ මාර්ගයක් සකස් කිරිම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

<u>02 - 06 ප්‍රාදේශීය ලේකම්,ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,පස්බාගේ කෝරළේ,නාවලපිටිය</u>
ප්‍රාදේශීය සෞඛ්‍ය කමිටු රැස්වීම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

<u>02 - 07 ලේකම්,ප්‍රධාන හා අධ්‍යාපන අමාත්‍යාංශය,පල්ලේකැලේ,කුණ්ඩසාලේ</u>
පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ උඩ පළාත උඩ බුලත්ගම කොට්ඨාස දෙකේ උප ප්‍රධාන සංඝනායක ගිනිමැල්ලගහ අමරවංශ ස්වාමින් වහන්සේගේ ආදාහන පූජෝත්සවය වෙනුවෙන් සභා අරමුදලින් රු:57150.00 මුදලක් වියදම් දැරිම සඳහා ගරු විෂයය භාර අමාත්‍යතුමාගේ අනුමැතිය ලබා ගැනීම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

<u>02 - 08 ලේකම්,වතු නිවාස හා ප්‍රජා යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශය,කොළඹ 03</u>
ස්ථාන මාරු 2022 යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

<u>02 - 09 පළාත් පාලන කොමසාරිස්,පළාත් පාලන දෙපාර්තමේන්තුව,පල්ලේකැලේ,කුණ්ඩසාලේ</u>

මධ්‍යම පළාතේ පළාත් පාලන ආයතන වල ලේකම්වරුන් සමග පැවැත්වූ සාකච්ඡාව යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 10 ප්‍රධාන ලේකම්,ප්‍රධාන ලේකම් කාර්යාලය,පල්ලේකැලේ,කුණ්ඩසාලේ
සභාවට අයත් 252 – 6380 දරණ කැබ් රථය අලුත්වැඩියා කිරීම - පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාවයන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 11 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
2022 සභා අරමුදල් සංවර්ධන යෝජනා ප්‍රගතිය යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 12 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
ගම සමග පිළිසඳරක් 2022 සංවර්ධන යෝජනා ප්‍රගතිය යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 13 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
2022.05.26 දින දක්වා අය කරන ලද මිශ්‍ර ආදායම් වල වටිනාකම පිළිබඳ සටහන යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 14 පළාත් පාලන කොමසාරිස්,පළාත් පාලන දෙපාර්තමේන්තුව,පල්ලේකැලේ,කුණ්ඩසාලේ
2022 වර්ෂය සඳහා සියලුම සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම අත්හිටුවීම සම්බන්ධවයි යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 15 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
මාසික ඉන්ධන නිකුත් කිරීමේ වියදම - 2022 අප්‍රේල් යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

**03. මහජන පෙත්සම්, පැමිණිලි හා ලිපි ඉදිරිපත් කිරීම**
03 - 01 ආර්.එම්.ඩී.කේ.ඒකනායක,නො.114/10,සුමංගල මාවත,කුරුණෑගල
ප්‍රාදේශීය සභාවට අයත් ගල් කොරිය සම්බන්ධවයි යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

**04. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න**
නැත

**05. යථා පරිදි කල් දී ඇති යෝජනා**
05 - 01 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
බච්චාගම,සේලම්බ්‍රිජ්,නාවලපිටිය යන ලිපිනයේ පදිංචි ෆාතිමා සියානා මිය විසින් සභාව වෙත යොමු කර ඇති කාණුවක් සකස් කර දෙන මෙන් කරන ලද ඉල්ලීම් ලිපිය අනුව තාක්ෂණ නිලධාරි විසින් රු:386,640.83 ඇස්තමේන්තුවක් සකස් කර ඇති අතර ඒ සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු මන්ත්‍රී ඒ.ජී.ටී.ඒ සිරිසේන මහතා
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා මුදල් තත්ත්වය යහපත් වූ පසු එම ව්‍යාපෘතිය සිදු කරන බවට අදාල පාර්ශවය දැනුවත් කිරීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 - 02 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
සමගිගම,බච්චාගම,නාවලපිටිය යන ලිපිනයේ පදිංචි ආර්.බී මුද්‍රිකා නන්දනී මිය විසින් සභාව වෙත යොමු කර ඇති අප ජලය බැහැර කරන පොදු කාණුව සකස් කර දෙන මෙන් කරනු ලැබූ ඉල්ලීම අනුව සභාවේ තාක්ෂණ නිලධාරි විසින් ඒ සඳහා රු:543,376.40 ඇස්තමේන්තුවක් සකස් කර තිබෙනවා.ඒ අනුව එම සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු මන්ත්‍රී ඒ.ජී.ටී.ඒ සිරිසේන මහතා
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා මුදල් තත්ත්වය යහපත් වූ පසු එම ව්‍යාපෘතිය සිදු කරන බවට අදාල පාර්ශවය දැනුවත් කිරීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 - 03 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
තෙබුගොල්ල මාර්ගය හරහා පිවිසෙන උඩවලව්වත්ත මාර්ගයේ ඉහළ කොටස දැනට සංවර්ධනය කර ඇති අතර කුමාර මහතාගේ නිවස අසල මීටර් 20 පමණ ප්‍රමාණයක් යාමට නොහැකි ලෙස අබලන්ව ඇති බැවින් ගම්වාසීන් විසින් එම මාර්ගය සංවර්ධනය කර දෙන මෙන් ඉල්ලීමක් කර තිබෙනවා.ඒ අනුව එම මාර්ගය සංවර්ධනය කිරීම සඳහා රු:75,000.00 මුදලක් මාර්ග නඩත්තු වලින් ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු මන්ත්‍රී ඒ.ජී.ටී.ඒ සිරිසේන මහතා
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව අනුව උඩවලව්වත්ත මාර්ගය සංවර්ධනය කිරීම සඳහා රු:75,000.00 මුදලක් මාර්ග නඩත්තු වලින් ලබා දීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 - 04 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
2022.03.10 දින පැවති නිවාස හා ප්‍රජා කමිටුවේදී පෙර පාසල් සංසදයේ ලේකම්තුමිය විසින් පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පෙර පාසල් පාලිකාවන් සඳහා සෞන්දර්යාත්මක වෙනස් ආකාරයේ (ඔරිගාමි කලාව පිළිබඳ) පුහුණු වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම පිළිබඳ ඉල්ලීමක් කරන ලද අතර ඒ අනුව එම වැඩසටහන ක්‍රියාත්මක කිරීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු උප සභාපති එච්.ඒ නන්දසෝම මහතා
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව ක්‍රියාත්මක කිරීම සඳහා ඒකමතිකව අනුමැතිය ලබා දුන් අතර එම යෝජනාව ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය සඳහා යොමු කිරීම සුදුසු බවටත් ඒකමතිකව තීරණය කරන ලදී.

05 - 05 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
මෙම ආයතනයේ සේවයේ නියුතු ජානක සේනාරත්න මයාගේ වැටුපෙන් ලලිත් කුමාරතුංග මයා විසින් ලබා ගන්නා ලද ණය වාරික අයකර ගනු ලබන අතර ඒ හේතුවෙන් ඔහුගේ පවුල නඩත්තු කිරීම විශාල ගැටලුවක්

බවට පත් වී ඇති බැවින් ලලිත් කුමාරතුංග මයාගේ මුරකරු රැකියාව එම සේවක මහතා වෙත ලබා දෙන මෙන් ඉල්ලීමක් කර ඇති අතර මේ වන විට සභාවේ මුරකරු තනතුර පුරප්පාඩුව පවතී.නව බඳවා ගැනීමද මේ කාල වකවානුවේ සිදු කළ නොහැකියි.කා.කා.ස තිදෙනෙකු හා කාර්ය සාධන බලකායේ එක් සේවකයෙකුද අනුයුක්ත කර ඇති බැවින් සේවා අවශ්‍යතාවය මත මෙම සේවක මහතා මුරකරු තනතුරේ සේවයේ යොදවා ගත හැකි අතර මේ සම්බන්ධයෙන් පළාත් පාලන කොමසාරිස්තුමාගේ අනුමැතිය සඳහා යොමු කිරීම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු මන්ත්‍රී එම්.එල්.සී.ආර් මොල්ලිගොඩ මහතා</u>
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව ගරු සභාපතිතුමාගේ යෝජනාව අනුව කටයුතු කිරීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

<u>05 - 06 ගරු මන්ත්‍රී එච්.ජී මෛත්‍රීපාල මහතා</u>
කැන්දෝපිටිය ග්‍රාම සේවා වසමට අයත් කොට්ටුන්න ජල උල්පතින් පානිය ජලය ලබා දීම සඳහා 150,000.00 මුදලක් ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු මන්ත්‍රී කේ.ඕ සෝමතිලක මහතා</u>
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා තාක්ෂණ නිලධාරි මගින් ඇස්තමේන්තු සකස් කර ඉදිරි කටයුතු සිදු කිරීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

<u>05 - 07 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>
මුදල් අමාත්‍යාංශය මගින් නිකුත් කරන ලද අයවැය චක්‍රලේඛ අංක 03/2022 අනුව 2022 වර්ෂයේ සභා අරමුදල් සංවර්ධන යෝජනා පමණක් ක්‍රියාත්මක කර අනෙකුත් කරුණු සඳහා චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කිරීම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු මන්ත්‍රී ජී.එස්.ඒ ෆොන්සේකා මහතා</u>
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව ගරු සභාපතිතුමාගේ යෝජනාව අනුව කටයුතු කිරීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

<u>05 - 08 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>
වෙරළ සංරක්ෂණ හා පහත්බිම් සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් විසින් සභාව වෙත යොමු කරන ලද ලිපිය අනුව පළාත් පාලන බල සීමාව තුළ පිහිටි ඇළ මාර්ගයන්හි එවා ඇති ලේඛනය අනුව ඉවුරු දෙකෙහිම ඉවුරේ මායිමේ සිට දුර ප්‍රමාණයක් රක්ෂිත ප්‍රදේශයක් වශයෙන් ප්‍රකාශයට පත් කිරීම සම්බන්ධයෙන් සභාවේ එකගත්වය ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු මන්ත්‍රී ශාන්තලාල් පෙරේරා මහතා</u>
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව ගරු සභාපතිතුමාගේ යෝජනාව අනුව කටයුතු කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

<u>05 - 09 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>

සභාව සතු ජේසීබී යන්ත්‍රය කුලියට ලබා දීමේ ගාස්තු පහත පරිදි සංශෝධනය කිරිම සුදුසු බවට මම යෝජනා කරමි.

ජේසීබී යන්ත්‍රය හා ගල් රෝල සඳහා කුලී මුදල(පැයකට) - රු: 6000.00

නගර සභා කසල ව්‍යාපෘතිය සඳහා - රු: 4000.00

<u>ගරු මන්ත්‍රී මහින්ද ගුණසේකර මහතා</u>

එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව ගරු සභාපතිතුමාගේ යෝජනාව අනුව කටයුතු කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

<u>05 - 10 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>

සභාවේ සේවයේ නියුතු ක්ෂේත්‍ර නිලධාරින් විසින් සභාව වෙත ඉල්ලීමක් ඉදිරිපත් කරලා තිබෙනවා ප්‍රවාහන වියදම් අධික බැවින් ඒ සඳහා සහනයක් සලසා දෙන ලෙස.එම ඉල්ලීම පිළිබඳ සලකා බලා සතියකට දින දෙකක් සංයුක්ත දීමනාවෙන් අඩක් ගෙවීම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු මන්ත්‍රී ජී.එස්.ඒ ෆොන්සේකා මහතා</u>

එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව ගරු සභාපතිතුමාගේ යෝජනාව අනුව ක්ෂේත්‍ර සංවර්ධන නිලධාරින් සඳහා සතියකට දින දෙකකට සංයුක්ත දීමනාවෙන් අඩක් ගෙවීම සඳහා කටයුතු කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

<u>05 - 11 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>

2021.12.31 දිනට ස්ථාවර වත්කම් සමීක්ෂණය අනුව වත්කම් ලේඛනයේ පහත සඳහන් දේපල ඉවත් කිරිම සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

- උඩ රඹුක්පිටිය හිද්දේගෙදර ළිඳ
- උඩ රඹුක්පිටිය ගෙදර කුඹුර ළිඳ
- උඩ රඹුක්පිටිය පිහිල්ල පිහිටි පොදු ළිඳ
- රඹුක්පිටිය ප්‍රජා ශාලාව
- අළුත්ගම පොදු ළිඳ
- පල්ලේ රඹුක්පිටිය කළුගල්පතන සුසාන භූමිය
- ඉගුරුඔය ලැයිම අසල පිහිටි ළිඳ
- අඹගහවත්තේ ළිඳ
- තේලමලේ කැලෑ ගම්මානයේ ලොකු ළිඳ
- වැවේගම වැව අසල ළිඳ

- පල්ලේගම ගුරුලැල්ලවත්ත සුසාන භූමිය
- වෙරලුගස්හින්න රොමානිස්ගේ නිවස අසල ළිද
- ෂෙම්රොක් කොළණිය අසල ළිද
- දඩුබැදිරුප්ප ළිද
- කටුකිතුල ජයසේකරගේ නිවස අසල ළිද
- ඉඹුල්පිටිය ගල්ඔය පිහිල්ල
- දෙකිඳ අඹගහමුල කුඹුරේ ළිද
- දෙකිඳ උඩහකැල්ලේ ළිද

<u>ගරු මන්ත්‍රී එම්.එල්.සී.ආර් මොල්ලිගොඩ මහතා</u>
එම යෝජනාව මම ස්ථිර කරමි.

<u>ගරු උප සභාපති එච්.ඒ නන්දසෝම මහතා</u>
ගරු සභාපතිතුමා රඹුක්පිටිය ප්‍රජා ශාලාව තියෙනවා නේද?

<u>ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>
ලේකම්තුමියගෙන් විස්තර ලබා ගැනීම සඳහා මහා සභාව කාරක සභාවක් බවට පත් කරනවා.

<u>ලේකම් කේ.ප්‍රියංකා චාන්දනී මිය</u>
රඹුක්පිටිය ප්‍රජා ශාලාව නමින් ප්‍රජා ශාලා දෙකක් තියනවා.එක් ප්‍රජා ශාලාවක් තමයි ඉවත් කරන්න ඕනි.

<u>ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>
නැවත කාරක සභාව මහා සභාවක් බවට පත් කරනවා.රඹුක්පිටිය ප්‍රජා ශාලාව නමින් ලේඛනයේ දෙකක් සඳහන් වෙනවා.එකක් තමයි අයින් කරන්න ඕනි.

<u>ගරු මන්ත්‍රී ඒ.ජී.ටී.ඒ.සිරිසේන මහතා</u>
දෙකේ කණුවේ ප්‍රජා ශාලාව සංවර්ධනය කරන්නත් කමිටුවෙන් සාකච්ඡා උනා.

මේ පිලිබඳ සලකා බැලූ මහා සභාව ගරු සභාපතිතුමාගේ යෝජනාව අනුව උක්ත සඳහන් කරන ලද වත්කම්,වත්කම් ලේඛනයෙන් ඉවත් කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

<u>05 - 12 ගරු මන්ත්‍රී ටී.ඒ.ඩී.සී දමයන්ති මිය</u>
2022 වර්ෂයේ මා හට ලැබෙන ප්‍රතිපාදන මුදලින් පහත සඳහන් කටයුතු සඳහා රු:50,000.00 මුදලක් වෙන් කිරිම සුදුසු බවට මම යෝජනා කරමි.

- නාවලපිටිය කහමාන ශ්‍රී රංසිමාලාකාරාම විහාරස්ථානයේ පවත්වා ගෙන යනු ලබන පුස්තකාලය සඳහා පොත් රාක්ක ලබා දීමට රු:50,000.00

<u>ගරු මන්ත්‍රී ශාන්තලාල් පෙරේරා මහතා</u>
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා අනුමැතිය ලබා ගැනීමට මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමා වෙත යොමු කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 - 13 ගරු මන්ත්‍රී ටී.ඒ.ඩී.සී දමයන්ති මිය

2022 වර්ෂයේ මා හට ලැබෙන ප්‍රතිපාදන මුදලින් පහත සඳහන් කටයුතු සඳහා රු:70000.00 මුදලක් වෙන් කිරිම සුදුසු බවට මම යෝජනා කරමි.

- පස්බාගේ වත්ත මාර්ගයේ කොටසක් සංවර්ධනය කිරිම රු:70,000.00

ගරු මන්ත්‍රී ශාන්තලාල් පෙරේරා මහතා

එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා තාක්ෂණ නිලධාරි මගින් ඇස්තමේන්තු සකස් කර ඒ අනුව ඉදිරි කටයුතු සිදු කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 - 14 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා

2022.05.18 දින පැවති නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුවේදී ගන්නා ලද නිර්දේශ අනුව පහත සඳහන් කටයුතු සඳහා සභා අනුමැතිය ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

01. අළුතින් පිහිටුවන ලද ඉගුරුඔය උතුර ප්‍රජා මණ්ඩලය සඳහා

02. 2022 වර්ෂය සඳහා යෝජිත හෙඩ්‍රි ඇතටන් ගුරුත්ව ප්‍රජා ජල යෝජනා ක්‍රමය සඳහා

03. මැදගහවතුර සුමිතුරෝ ප්‍රජා මණ්ඩලයේ ඉල්ලීම මත ඔවුන්ට ලැබීමට නියමිත ප්‍රජා මණ්ඩල ප්‍රතිපාදන යොදා ගනිමින් පුස්තකාලය සඳහා අවශ්‍ය ඩෙස් බංකු සාදා ගැනීමට

04. පල්ලේගම ප්‍රජා මණ්ඩලයේ ඉල්ලීම මත ඔවුන්ට ලැබීමට නියමිත ප්‍රජා මණ්ඩල ප්‍රතිපාදන යොදා ගනිමින් පල්ලේගම මාර්ගය ප්‍රතිසංස්කරණය කිරිම සඳහා

05. පෙර පාසල් ගුරුවරුන් සඳහා පොත් බයින්ඩින් වැඩසටහනක් පැවැත්වීමට යෝජිත බැවින් ඒ සඳහා අවශ්‍ය ද්‍රව්‍ය ඔවුන් සපයා ගත්තද පොත් බයින්ඩින් ආදර්ශය සකස් කර පෙන්වීම සඳහා (20 දෙනෙකු සඳහා)

- කවරින් ජේපර් 20
- චිප් බෝර්ඩ් 20
- ගම් කිලෝ ග්‍රෑම් 01
- ලෙදර්ට් 05
- සුදු පොප්ලින් යාර 01

ගරු උප සභාපති එච්.ඒ නන්දසෝම මහතා

එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව ගරු සභාපතිතුමාගේ යෝජනාව අනුව උක්ත වැඩසටහන් ක්‍රියාත්මක කිරිම සඳහා ඒකමතිකව අනුමැතිය ලබා දෙන ලදී.

05 - 15 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා

සභාවේ නඩත්තු කටයුතු සඳහා පැවරී ඇති පහත සඳහන් කාපට් මාර්ග දෙපස හා මාර්ග උරහිස නඩත්තු කිරිම සුදුසු බවට මම යෝජනා කරමි.

| ව්‍යාපෘතියේ නම | නඩත්තු කරන දුර(කි.මී) |
|---|---|
| 01. නාවලපිටිය පිටකන්ද මාර්ගය | 4.10 |
| 02. දෙකිද මාපාකන්ද මාර්ගය | 7.40 |
| 03. කඩියන්ලෙන වෙස්ට්හෝල් මාර්ගය | 8.10 |
| 04. අලුත්ගම ගම මැද මාර්ගය | 2.70 |
| 05. දෙකිද වෙරලුගොල්ල මාර්ගය | 2.65 |
| 06. නාගස්තැන්න මාර්ගය | 11.40 |

ගරු මන්ත්‍රී වී.මුරලිදරන් මහතා

එම යෝජනාව මම ස්ථිර කරමි.

ගරු මන්ත්‍රී එච්.ජී මෛත්‍රීපාල මහතා

වැලිගම්පළත් හන්දියට විතරයි පළාත් සභාවට අයිති.එතනින් එහාට නෑ.

ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා

ඇස්බෝන් සිට දෙකිද පාරත් මේ ලැයිස්තුවට ඇතුළත් කරන්න.

ගරු මන්ත්‍රී වී.මුරලිදරන් මහතා

කඩියන්ලෙන නගරයේ වෙස්ට්හෝල් යන පාර නම් කරලා පුවරු ගහලා තිබුණා.ඒ වගේම සභාව සතු සියලු මාර්ග වල සීමා සලකුණු කිරිම සඳහා පුවරු ගැසීම සුදුසු බවට මම යෝජනා කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත වැඩසටහන ක්‍රියාත්මක කිරිම සඳහා ඒකමතිකව අනුමැතිය ලබා දෙන ලදී.

05 - 16 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා

පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය ලේකම්තුමාගේ ඉල්ලීම අනුව ෂෙම්රොක් වැඩිහිටි නිවාසය සඳහා කසල බඳුන් 02ක් ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු උප සභාපති එච්.ඒ නන්දසෝම මහතා

එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව ක්‍රියාත්මක කිරිම සඳහා ඒකමතිකව අනුමැතිය ලබා දෙන ලදී.

05 - 17 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා

වැවේගම ශ්‍රී මුනිතහස්ත කලායතනය වැවේගම ප්‍රජා ශාලාවේ පැවැත්වීම සඳහා අනුමැතිය ලබා දෙන මෙන් කරන ලද ඉල්ලීම අනුව එම ප්‍රජා ශාලාවේ එම කලායතනය ආරම්භ කර පවත්වා ගෙන යන මෙන් කලායතනාධිපති වෙත ලිඛිතව දැන්වීම සුදුසු බවටත් පසුව ප්‍රජා ශාලාව සඳහා අය කරනු ලබන ගාස්තු සම්බන්ධයෙන් සභාව මගින් තීරණයක් ගැනීම සුදුසු බවටත් මම යෝජනා කරමි.

ගරු මන්ත්‍රී එස්.එල්.අරුණ ශාන්ත මහතා

එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව ක්‍රියාත්මක කිරිම සඳහා ඒකමතිකව අනුමැතිය ලබා දෙන ලදී.

<u>05 - 03 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>

මෙම සභාව සතු වාහන සඳහා ඉන්ධන සැපයුම නාවලපිටිය විවිධ සේවා සමුපකාර සමිතිය සතු ඉන්ධන පිරවුම්හල් වලින් ඉටු කරන අතර දැනට පවතින ඉන්ධන හිඟය හේතුවෙන් ඉන්ධන ණයට ලබා දීමට නොහැකි බව දන්වා තිබෙනවා.සභාව සතු වාහන සඳහා ඉන්ධන අඛණ්ඩව ලබා ගැනීම සඳහා රු:200,000.00 මුදලක් ඇප තැම්පත් මුදල් වශයෙන් තබා ගැනීම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු මන්ත්‍රී එම්.එල්.සී.ආර් මොල්ලිගොඩ මහතා</u>

එම යෝජනාව මම ස්ථිර කරමි.

<u>ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>

ආයතන සියල්ලම කලින් මුදල් බදින්න ඕනි.ඒක තමයි සමුපකාර නීතිය.තෙල් හිඟය නිසා ආවරණයක් තමයි මේකෙන් වෙන්නේ.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව ක්‍රියාත්මක කිරිම සුදුසු බවට ඒකමතිකව තිරණය කරන ලදී.

<u>05 - 19 ගරු මන්ත්‍රී පූජ්‍ය නමඩගස්වැව සුගතසෝම හිමි</u>

රොසැල්ල ටෙම්පල්ස්ටෝ වත්ත පිහිටි පොදු වොලිබෝල් ක්‍රීඩා පිටියට විදුලි සම්බන්ධතාවය සමග බල්බ සවි කිරිම සඳහා ලකී බෝයිස් ක්‍රීඩා සමාජය මගින් ඉල්ලීම් කර ඇත.මෙම ක්‍රීඩා පිටිය තුළින් අවට සිටින සියලුම වතුකරයේ ළමයින් වොලිබෝල් ක්‍රීඩා කරමින් පුහුණුව ලබන ස්ථානයකි.මේ සඳහා විදුලි සම්බන්ධතාවය සමග විදුලි බල්බ ලබා දීම සඳහා 2022 වර්ෂයේ ප්‍රාදේශීය සභා අරමුදල් මගින් මා හට වෙන් කරන ලද ප්‍රතිපාදන වලින් රු:100,000.00 මුදලක් ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු මන්ත්‍රී ශාන්තලාල් පෙරේරා මහතා</u>

එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාවේ ක්‍රීඩා පිටිය සංවර්ධනය කිරිම සඳහා තාක්ෂණ නිලධාරි මගින් ඇස්තමේන්තු සකස් කිරිමටත් විදුලි සම්බන්ධතාවය හා විදුලි බල්බ ලබා දීම සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය සඳහා යොමු කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

<u>06. **කාරක සභා වාර්තා සභා සම්මත කිරිම.**</u>

| | |
|---|---|
| 06 - 01 මුදල් කාරක සභාව | - 2022.05.09 |
| 06 - 02 නිවාස ප්‍රජා සංවර්ධන කාරක සභාව | - 2022.05.18 |
| 06 - 03 කාර්මික සේවා කාරක සභාව | - 2022.05.18 |
| 06 - 04 පරිසර හා පොදු පහසුකම් කාරක සභාව | - 2022.05.18 |
| 06 - 05 ගැටුම් සමථකරණ කාරක සභාව | - 2022.05.18 |

**07. <u>බැංකු සැසඳුම් ප්‍රකාශය,අභ්‍යන්තර විගණන වාර්තාව,ලැබීම් සාරාංශය,ගෙවීම් සාරාංශය,ගෙවීම් වාර්තාව,පුස්තකාල ප්‍රගතිය,ආදායම් රැස් කිරීමේ ප්‍රගතිය ඉදිරිපත් කිරීම</u>**

- 2022.04.01 දින සිට 2022.04.29 දක්වා වවුචර් අංක 363 සිට 495 දක්වා ගෙවීම් වවුචර් සභාගත කරන ලදී.
- බැංකු සැසඳුම් ප්‍රකාශය

ගිණුම් අංකය - 053100164889286

මාසය - 2022 අප්‍රේල්

| | | |
|---|---|---|
| 2022.04.01 දිනට මුදල් පොතේ ශේෂය | රු: 11,032,517.62 | |
| එකතු කළා මාර්තු මස මුළු ලැබීම් | රු: 4,486,859.58 | |
| අඩු කළා අප්‍රේල් මස මුළු ගෙවීම් | රු: 10,200,733.05 | |
| 2022.04.30 දිනට මුදල් පොතේ ශේෂය | | රු: 5,318,644.15 |
| <u>එකතු කළා</u> | | |
| නිකුත් කළත් ගෙවීමට ඉදිරිපත් නොකළ චෙක්පත් | රු: 590,152.40 | |
| | | <u>රු: 590,152.40</u> |
| | | 5,908,796.55 |
| <u>අඩු කළා</u> | | |
| බැංකු ගාස්තු | රු 108.00 | |
| අත ඉතිරි මුදල් | රු: 18,890.00 | |
| තැම්පත් කළ නමුත් උපලබ්ධි නොවූ චෙක්පත් | රු: 2,000.00 | |
| | | <u>රු: 20,998.00</u> |
| 2022.04.30 දිනට බැංකු ප්‍රකාශය අනුව ශේෂය | | **<u>රු:5,887,798.55</u>** |

- 2022 අප්‍රේල් මස ගෙවීම් සාරාංශය

| විස්තරය | මුදල (රු) |
|---|---|
| 01. වැටුප් හා දීමනා | 3,264,851.34 |
| 02. ගමන් වියදම් | 73,745.00 |
| 03. සැලසුම් හා උපකරණ | 1,014,619.40 |
| 04. ප්‍රාග්ධන වත්කම් අලුත්වැඩියාව හා නඩත්තුව | 280,726.05 |
| 05. ප්‍රවාහන සම්බන්ධතා හා ආවශ්‍යක සේවා | 103,165.29 |
| 06. පොලී ගෙවීම් ලාභාංශය හා ප්‍රසාද මුදල් | 39,480.35 |
| 07. ආධාර මුදල් දායක මුදල් සහනාධාර | 14,881.96 |
| 08. විශ්‍රාම වැටුප් විශ්‍රාම ප්‍රතිලාභ හා පාරිතෝෂික | 5,256.78 |
| **පුනරාවර්ථන වියදම් එකතුව** | **4,796,726.17** |
| 09. ප්‍රාග්ධන වැය | |
| 10. ණය ආපසු ගෙවීම් | 229,741.51 |
| **ප්‍රාග්ධන වැය එකතුව** | **229,741.51** |
| **පුන:වැය හා ප්‍රාග්:වැය මුළු එකතුව** | **5,026,467.68** |
| විවිධ ණය හිමියන් | 93,580.00 |
| කර්:ණය හිමියන් (309-3-1) | 560,689.97 |
| කර්:ණය හිමියන් (309-3-111) | 4,957,007.73 |
| කර්:ණය හිමියන් (304-5) | 9,800.00 |
| 10% කර්මාන්ත තැම්පත් | 62,739.83 |

| | |
|---|---|
| විවිධ තැම්පත් | 8,549.71 |
| මුද්දර තැම්පත් | |
| දේපල ණය | 9,307.05 |
| සේවක ණය | 700,000.00 |
| අත්තිකාරම් | |
| සමුච්චිත අරමුදල | |
| ලිපි ද්‍රව්‍ය ගබඩා අත්තිකාරම් | 65,640.00 |
| ජල ගබඩා අත්තිකාරම් | |
| අගරු චෙක්පත් | |
| කර්:ණය ගැතියන් | |
| **එකතුව** | 6,467,314.29 |
| **2022.04.30 දක්වා මුළු ගෙවීම් එකතුව** | **11,493,781.97** |

- 2022 අප්‍රේල් මස ලැබීම් සාරාංශය

| • අය විෂයය නාමයන් | මුදල (රු) |
|---|---|
| 10 වරිපනම් හා බදු | 180,344.00 |
| 20 කුලී | 853,493.80 |
| 30 බලපත්‍ර ගාස්තු | 34,250.00 |
| 40 සේවා සඳහා ගාස්තු | 124,197.00 |
| 50 වරෙන්තු ගාස්තු | 5,767.50 |
| 60 වෙනත් ආදායම් | 257,254.76 |
| 70 වෙනත් ආධාර | 2,926,019.00 |
| පුනරාවර්ථන හා ප්‍රාග්ධන ආදායම් එකතුව | **4,481,273.70** |
| ජල ණය ගැතියෝ | 196.00 |
| ජල තැම්පත් | 500.00 |
| මුද්දර | 3,200.00 |
| විවිධ තැම්පත් | 108,277.06 |
| සේවක ණය | 151,731.00 |
| කර්මාන්ත තැම්පත් | 548,202.29 |
| දේපල ණය | 9,307.05 |
| විවිධ ණය ගැතියෝ | |
| අත්තිකාරම් පියවීම | |
| අත්තිකාරම් පියවීම ජල ගබඩා | 475,696.40 |
| රු 25 මුද්දර | 1,525.00 |
| සැලසුම් හා උපකරණ | |
| කර්මාන්ත ණය ගැතියෝ | |
| වෙනත් ලැබීම් වල එකතුව | 1,298,634.80 |
| 2022.04.30 දක්වා මුළු ලැබීම් | **5,779,908.50** |

- 2022 අප්‍රේල් මස පුස්තකාල ප්‍රගතිය

01. නව සාමාජික සංඛ්‍යාව - 10
02. සාමාජිකත්වය අලුත් කළ සංඛ්‍යාව - 05
03. පොත් බැහැර දීම - 993
04. ව්‍යාප්ත සේවා -
05. රැස්කළ ආදායම(පුස්තකාල)- 1090.00
(නැණසල) - 1585.00

8.**ටෙන්ඩර් මණ්ඩලය**

08 - 01 පස්බාගේ කෝරලේ ප්‍රාදේශීය සභාවේ ඉහළ මහල සඳහා දොරක් සවි කර සීල් කිරිම සඳහා මිල ගණන් කැඳවීම.

| ද්‍රව්‍යය | සිටි ග්ලාස් ඇන්ඩ් ඇළුමිනියම්,නාවලපිටිය | සිටි හාඩ්වෙයාර් ඇන්ඩ් ඉලෙක්ට්‍රිකල්ස්,නාවලපිටිය | සිටි ග්ලාස් හවුස්,නාවලපිටිය |
|---|---|---|---|
| ඇළුමිනියම් දොර | 78000.00 | 79000.00 | 82000.00 |
| ග්ලැඩින් බෝර්ඩ් | 5400.00 | 5500.00 | 5900.00 |
| පොප් රිවර්ට් නූල | 2.50 | 2.75 | 3.00 |
| ග්‍රිල් කටු | 180.00 | 195.00 | 210.00 |
| ගැල්වනයිස් සී බාර් | 420.00 | 440.00 | 450.00 |
| සිලිකන් ගම් | 960.00 | 1200.00 | 1450.00 |
| වැඩ කුලිය | 15000.00 | 18000.00 | 16000.00 |

උක්ත මිල ගණන් පිළිබඳ සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය උක්ත කාරණය සඳහා අවම මිල ගණන් සපයා ඇති "සිටි ග්ලාස් ඇන්ඩ් ඇළුමිනියම්,නාවලපිටිය"යන ආයතනයෙන් අදාල කාර්යය ඉටු කර ගැනීම සුදුසු බවට තීරණය කරන ලදී.

08 - 02 මාර්ග නාම පුවරුවක් සැකසීම සඳහා මිල ගණන් කැඳවීම.

| සම්පත් ග්‍රිල් ගේට්ටු කර්මාන්තය,නාවලපිටිය | ලක් රූ,රඹුක්පිටිය,නාවලපිටිය | කුමාර වෙල්ඩින්,නාවලපිටිය |
|---|---|---|
| 19500.00 | 18500.00 | 20000.00 |

උක්ත මිල ගණන් පිළිබඳ සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය උක්ත කාරණය සඳහා අවම මිල ගණන් සපයා ඇති "ලක් රූ,රඹුක්පිටිය,නාවලපිටිය"යන ආයතනයෙන් අදාල කාර්යය ඉටු කර ගැනීම සුදුසු බවට තීරණය කරන ලදී.

08 - 03 කැනපි හට් එකක් සඳහා මිල ගණන් කැඳවීම.

| බැන්ඩියමුල්ල හාඩ්වෙයාර්,බැන්ඩියමුල්ල,ගම්පහ | කරුණාතිලක ටූල්ස් ස්ටෝර්ස්,වැලිසර,රාගම | Green Link Holdings,හිදැල්ලෙන,රත්නපුර |
|---|---|---|
| 127,000.00 | 144,250.00 | 76,975.00 |

උක්ත මිල ගණන් පිළිබඳ සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය උක්ත කාරණය සඳහා අවම මිල ගණන් සපයා ඇති "Green Link Holdings,හිදැල්ලෙන,රත්නපුර"යන ආයතනයෙන් අදාල මිලදී ගැනීම් සිදු කිරිම සුදුසු බවට තීරණය කරන ලදී.

08 - 04 RD 6662 ට්‍රැක්ටර් ටයර් සඳහා මිල ගණන් කැඳවීම.

| යූනියන් එන්ටර්ප්‍රයිසස්,කොත්මලේ පාර,නාවලපිටිය | කොත්මලේ ටයර් හවුස්,ගම්පොල පාර,නාවලපිටිය | ස්ටෙනෝර් ටයර් හවුස්,කොත්මලේ පාර,නාවලපිටිය |
|---|---|---|
| 26350.00 | 26150.00 | 26650.00 |

උක්ත මිල ගණන් පිළිබඳ සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය උක්ත කාරණය සඳහා අවම මිල ගණන් සපයා ඇති "කොත්මලේ ටයර් හවුස්,ගම්පොල පාර,නාවලපිටිය"යන ආයතනයෙන් අදාල මිලදී ගැනීම් සිදු කිරිම සුදුසු බවට තීරණය කරන ලදී.

08 - 05 ZA 5171 ජේසීබී යන්ත්‍රයේ පසුපස වම හා දකුණු පැත්ත වීදුරු සඳහා වීදුරු දමා සවි කිරිම සඳහා මිල ගණන් කැදවීම.

| ඉන්ද්‍රා ඉංජීනියරින්,රඹුක්පිටිය,නාවලපිටිය | උදාර මෝටර්ස්,ඉඹුල්පිටිය,නාවලපිටිය | ඔමේගා මෝටර්ස්,ගෙලිඔය |
|---|---|---|
| 146,000.00 | 151,000.00 | 155,000.00 |

උක්ත මිල ගණන් පිළිබඳ සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය උක්ත කාරණය සඳහා අවම මිල ගණන් සපයා ඇති "ඉන්ද්‍රා ඉංජීනියරින්,රඹුක්පිටිය,නාවලපිටිය"යන ආයතනයෙන් අදාල කාර්යය ඉටු කර ගැනීම සුදුසු බවට තීරණය කරන ලදී.

08 - 06 සභාව සඳහා ජලනල උපාංග මිලදී ගැනීම සඳහා මිල ගණන් කැදවීම.

| විස්තරය | මහවැලි හාඩ්වෙයාර්,බලංතොට | මහනුවර ඒජන්සීස්,මහනුවර | කේශව හාඩ්වෙයාර්,බච්චාගම, නාවලපිටිය |
|---|---|---|---|
| 20mm Socket | 66.00 | 62.70 | 66.00 |
| 32mm Socket | 150.00 | 142.50 | 150.00 |
| 40mm Socket | 215.00 | 204.25 | 215.00 |
| 50mm Socket | 310.00 | 294.50 | 310.00 |
| 63mm Socket | 430.00 | 408.50 | 430.00 |
| 90mm Socket | 1265.00 | 1201.75 | 1265.00 |
| 110mm Socket | 1720.00 | 1634.00 | 1720.00 |
| 40mm Valve Socket | 255.00 | 242.25 | 255.00 |
| 32mm Foucet Socket | 150.00 | 142.50 | 160.00 |
| 40mm Foucet Socket | 250.00 | 237.50 | 250.00 |
| 50mm Foucet Socket | 365.00 | 346.75 | 365.00 |
| 32mm Elbow | 160.00 | 152.00 | 160.00 |
| 50mm Elbow | 460.00 | 437.00 | 460.00 |
| 63mm Elbow | 700.00 | 665.00 | 700.00 |
| 90mm Elbow | 2000.00 | 1900.00 | 2000.00 |
| 32mm Bend | 240.00 | 228.00 | 240.00 |
| 50mm Bend | 800.00 | 760.00 | 800.00 |
| 63mm Bend | 1400.00 | 1330.00 | 1400.00 |
| 110mm Bend | 7800.00 | 7410.00 | 5300.00 |
| 20mm T Socket | 85.00 | 80.75 | 85.00 |
| 40mm T Socket | 395.00 | 375.25 | 395.00 |
| 50mm T Socket | 645.00 | 612.75 | 645.00 |
| 63mm T Socket | 900.00 | 855.00 | 930.00 |
| 32mm*20mm T | 220.00 | 209.00 | 220.00 |
| 90mm * 63mm T | 2720.00 | 2584.00 | 2720.00 |
| 50mm Rubber Socket | - | - | - |
| 50mm Valve | 1840.00 | 1638.75 | 2230.00 |

| | | | |
|---|---|---|---|
| 40mm Valve | 1425.00 | 1192.25 | 1495.00 |
| 63mm Valve | 2530.00 | 2403.50 | 3280.00 |
| 20mm Pipe | 850.00 | 807.50 | 850.00 |
| 32mm Pipe | 3570.00 | 3391.50 | 1630.00 |
| 40mm Pipe | 5260.00 | 4997.00 | 3560.00 |
| 90mm Pipe | 30120.00 | 28614.00 | - |
| 110mm Pipe | 38130.00 | 36223.50 | - |
| Solvent Cement 500 | 3675.00 | 3491.25 | 3675.00 |
| Blade | 295.00 | 225.00 | 190.00 |
| 20mm Elbow | 70.00 | 66.50 | 70.00 |
| 20mm Valve Socket | 82.00 | 77.90 | 82.00 |
| 20mm Valve | 480.00 | 394.25 | 330.00 |
| 40mm Valve | 1425.00 | 1192.25 | 1255.00 |
| 50mm Valve | 1840.00 | 1638.75 | 1725.00 |
| 50mm * 20mm Clamp | - | - | 2100.00 |
| 50mm* 20mm T Socket | - | 437.00 | 460.00 |
| 63mm Valve Socket | 470.00 | 446.50 | 470.00 |
| 63mm*20mm Clamp | - | - | 2100.00 |
| 63mm Gum Socket | - | 408.50 | 2600.00 |
| 63mm Pipe | 12080.00 | 11476.00 | 12545.00 |
| 63mm Valve | 2530.00 | 2403.50 | 2930.00 |
| 90mm Rubber Socket | - | - | - |
| 63mm Rubber | - | - | - |
| 50mm Pipe | 7560.00 | 7182.00 | 7560.00 |
| 90mm*20mm Clamp | - | - | - |

උක්ත මිල ගණන් පිළිබඳ සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය උක්ත භාණ්ඩ මිලදී ගැනීම සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුවට යොමු කර තීරණයක් ගැනීම සුදුසු බවට තීරණය කරන ලදී.

**<u>09. වෙනත් කරුණු</u>**

නැත

සාකච්ඡා කිරීමට වෙනත් කරුණු නොවූ බැවින් ගරු සභාපතිතුමා විසින් පැමිණ සිටි පිරිසට ස්තූතිය පළ කරමින් සභාවේ වැඩ කටයුතු ප.ව 1.00 පමණ අවසන් කරන ලදී.

සභාපති,
පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව

ගරු මන්ත්‍රී වී.මුරලිදරන් මහතා

අපි සභාවට යෝජනා දැම්මට පස්සේ නාවලපිටිය අවට මිල ගණන් විතරයි එන්නේ.දුර ප්‍රදේශ වලින් දෙන්නේ නෑ මිල ගණන් වෙනස් වන නිසා.

ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා

අපිට ගල්වලට ඔප්පුවක් ලැබුණා.ගල්වල හිමියන් සියලු දෙනාගේ සාකච්ඡාව උනේ ගල් වල මිල වැඩි කරන්න වෙනවා කියලා.නමුත් අර්බුදකාරී තත්ත්වය තමයි ගල් විකිණීම ඉතා අපහසු වෙලා තියන එක.

ගරු මන්ත්‍රී වී.මුරලිදරන් මහතා

බච්චාගම සුසාන භූමිය සම්බන්ධ ගැටලුව නම් ඉක්මනින් විසඳන්න වෙනවා.කමිටුව මගින් සාකච්ඡා කරන දේවල් බලන්න වාහන නැති ගැටලුව තමයි තියෙන්නේ.

ගරු මන්ත්‍රී ඒ.ජී.ටී.ඒ සිරිසේන මහතා

ඔප්පුව නගර සභාවෙන් දෙන්නම් කියලා කිව්වා ලැබුනද දන්නේ නෑ.

ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා

ඒක ලැබුනේ නෑ.කාර්මික සේවා කමිටුවේදී සාකච්ඡා වූ පරිදි මාර්ග පුවරු නම් කිරිම සිදු කරන්න ඕනි.කාර්මික සේවා කමිටුවේ සඳහන් මාර්ග වලට අමතරව නාගස්තැන්න මාර්ගය,දොලොස්බාගේ මාර්ගය,පල්ලේගම,කඩියන්ලෙන සඳහා සීමාව දැක්වෙන පුවරු දාන්නත් ඕනි.

ගරු මන්ත්‍රී එච්.ජී මෛත්‍රීපාල මහතා
පල්ලේගම ගොඩනැගිලි හදලා තියෙන්නේ අපේ සීමාවේ.

ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
අපේ සීමාවේ හදලා නෑ මන්ත්‍රීතුමා.

ගරු මන්ත්‍රී ටී.ඒ.ඩී.සී දමයන්ති මිය
අළුතින් හදපු බ්ලොක් ගල් වැඩපළ තියනවනේ.ලී මෝල හදපු වෙලාවත් මං කථා කරනකොට කිව්වා ඇලෙන් මෙහා කියලා.දැන් ඊටත් මෙහා ගොඩනැගිලි හදලා.අපේ සීමාව තවත් මෙහාට වෙනවද?

ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
අපි කමිටුවටම ඒකෙ වගකීම පවරමු සිතියම බලලා මායිමක් හොයා ගන්න.ඒ වගේම උඩ රඹුක්පිටිය ගැටලුව සමථ මණ්ඩලයට ඉදිරිපත් කරන්න කියලා සභාව ඉදිරිපත් උනා.සභාව ඒකෙ පළමු පාර්ශවය වෙලා එයාලා දෙවනි පාර්ශවය උනා.අපි විපුල පුෂ්පකුමාර හා ගාමිණී සමරතුංග කියන දෙන්නටම අපි දැනුම් දුන්නා සමථ මණ්ඩලයට යන්න කියලා.

ගරු මන්ත්‍රී ඒ.ජී.ටී.ඒ සිරිසේන මහතා
අපි සභාවෙන් තීරණයක් ගත්තා නීතිඥ මහතෙකුගේ උපදෙස් ලබා ගමු කියලා.

ගරු උප සභාපති එච්.ඒ නන්දසෝම මහතා
මේක දිගින් දිගටම යන ගැටලුවක්.දැන් සෑහෙන කාලයක්.සභාවට අයිති පාරක් තමයි මේක.විපුල පුෂ්පකුමාර කැමති නෑ එයා පෞද්ගලිකව සමථ මණ්ඩලයට යන්න.ගාමිණී සමරතුංග කැමතිත් නෑ ඒකට.

ගරු මන්ත්‍රී එම්.එල්.සී.ආර් මොල්ලිගොඩ මහතා
දෙපාර්ශවයම ගෙනල්ලා අඩි 04 සලකුණු කරා පාරේ.එදා ගැටලුවක් තිබුනේ නෑ.

ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
වැවේගම වැල් පෙට්ටිය අලුත්වැඩියා කිරිමේ වියදම් ලැයිස්තුව පිළිබද තාක්ෂණ නිලධාරි මහතා ගිහින් පරික්ෂා කරන්න කියන්න.වැල් පෙට්ටිය කඩන පුද්ගලයෙක් ඉන්නවා නම් ගමේ අය උදව් කරන්න ඕනි හොයාගන්න.වැල් පෙට්ටිය ගෙයක් තියන තැනකින් හදන්න කියන්න.

ගරු මන්ත්‍රී මහින්ද ගුණසේකර මහතා
වතුර බෙදා හැරීමේදීත් තෝමස්ට සැලකිලිමත් වෙන්න කියලා කියන්න ඕනි.සමහර අයට දවස් 4ක් විතර වතුර නෑ.එහෙම උනාම තමයි ඔය වගේ ගැටලු එන්නේ.

ගරු මන්ත්‍රී එස්.ඒ.ටී පුෂ්පකුමාර මහතා
ගමේ අය ගෙනල්ලා දැනුවත් කිරිමක් කළා නම් හොදයි.

ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
දෙල්ගහඇල්ල සුසාන භූමියේ මාර්ගය ලබා දිම සම්බන්ධයෙන් අපි 2014 ට කලින් සභාවකදි තීරණයක් ගත්තා.අදාල පාර්ශවයෙන් ඒ ලියුම ලබා දෙයි.

ගරු මන්ත්‍රී ඒ.ජී.ටී.ඒ සිරිසේන මහතා

ඉන්ධන ගැටලුව ගැන තමයි මං කථා කරන්නේ.පොදු ප්‍රවාහන සේවයේ වත් අපිට සාධාරණ මිලකට ප්‍රවාහන ගාස්තුව සංශෝධනය කරගන්න පුලුවන් නම් හොදයි.ඒ වගේම භාණ්ඩ ප්‍රවාහනයේදීත් මිල ගණන් වත් දෙන්න කටයුතු කරන්නේ නැත්තේ ඉන්ධන ගැටලුව නිසා.පොදු ප්‍රවාහනයෙ වත් මිල අඩු වීමක් තියෙනවනම් හොදයි.ඩෙංගු රෝගීන් ගැන කථා කළොත් ඩෙංගු රෝගීන් වාර්තා වීම ඉහළ ගිහින් තියනවා.පත්‍රිකා ගහලා දැනුවත් කිරිමක් කළොත් හොදයි.

ගරු මන්ත්‍රී එම්.එල්.සී.ආර් මොල්ලිගොඩ මහතා
කෞදර්ස්ලැන්ඩ් ජල ටැංකියේ වැල් පෙට්ටියේ පියන නැති නිසා කවුරු හරි පුද්ගලයෙක් වැල් පෙට්ටිය වහලා.පහළ ගෙවල් වලට වතුර නෑ.වැල් පෙට්ටියට පියනක් දාගන්න ඕනි.ඒ වගේම ප්‍රධාන බටෙන් වතුර දීලා තියෙනවා.ඒකෙන් සමහර අයට වතුර නෑ.

ගරු මන්ත්‍රී එච්.ජී මෛත්‍රීපාල මහතා
ඉගුරුඔය දිය ඇල්ලේ ගැටලුවට නඩු දාලා තියෙනවා.ඒ නඩු දාලා තියෙන්නෙත් පුද්ගලික අය.එයාලා නඩුවට ඉදිරිපත් උනොත් සභාවෙන් මොකක්ද එයාලාට ලබා දෙන සහයෝගය.

ගරු මන්ත්‍රී ජී.කේ.පී ෆොන්සේකා මිය
නඩු දාලා තියෙන්නේ අනවසරයෙන් ඇතුල් වෙනවා කියලා නෙවෙයි.වැට මායිම් බලන්න ගිය අවස්ථාව නිසා තමයි නඩු දාලා තියෙන්නේ කියලා ආරංචි උනා.

ගරු මන්ත්‍රී එච්.ජී මෛත්‍රීපාල මහතා
නීතිපති දෙපාර්තමේන්තුවෙන් ලිපියක් ඇවිත් තියෙනවා මට මෙම සභාවට දැනුම් දුන්නා කියලා.මං කීප වතාවක් ඇහුවා අයවැය සම්මත උනේ කොයි මාසෙද කියලා.

ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
ඔබතුමා දන්නවනේ උනේ මොකක්ද කියලා.ඔක්කොම වාර්තා ටික අපි දීලා තියෙනවනේ.

ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
වතුර බිල ගැන දැනුවත් කරලා යවන කෙටි පණිවිඩයේ ඩෙංගු පිළිබද දැනුවත් කිරිමක් යවන්න පුලුවන්.ඒ වගේම වතුර බිලෙත් වෙනත් කරුණු යටතේ සටහනක් දාලා යවන්න පුලුවන්.